# ඩාබිඳු

පුවත්පතක් වශයෙන් ලියාපදිංචි කර ඇත

ආරම්භය 1984

42 වන කාණ්ඩය | 01 වන කලාපය | 2025 සැප්තැම්බර් කාලපය


# හුස්මට පණක්, හඬට වටිනාකමක්

# ඩාබිඳුවට 41ක්



රටේ පුරවැසියන්ගෙන් හරි අඩකට වඩා කාන්තාවන් වීම හේතුකොට ගෙන සමාජ, ආර්ථික, හා දේශපාලන තල වල ඔවුන්ගේ හඬ අවදි කරමින් අප ගමන් මගේ 41 වෙනි ජය ටැඹ වෙත කාන්තා කණ්ඩායමක් ලෙස අප පැමිණ ඇත. මේ ජයග්‍රහණය සැමරීම රටේ කම්කරු ප්‍රජාවගේ ම ජීවිතවල වූ ගෞරවනීය වෙනස සනිටුහන් කිරීමයි.

කුඩා කණ්ඩායමක් ලෙස පෙර මග ගත් අප අද දවස වන විට ප්‍රාදේශීය, ජාතික, කලාපීය හා ගෝලීය මට්ටමින් ජාලගත වී සිටිමු. වැඩ කරන පන්තියේ කම්කරුවන්ගේ අයිතීන් වෙනුවෙන් ගැඹුරු සංවාදයේ යෙදීමට, ප්‍රතිපත්ති සකස් කිරීමට අවැසි මාවතේ අඛණ්ඩ නියෝජනය ලබා ගන්නේ බිම් මට්ටමේ ආන්තීකරණයට හසුව හුදෙකලා කල මිනිසුන්ගේ රැකියා ගරුත්වය වෙනුවෙන් සටන් කළෙමු.

ගෝලීය තලයේ සිදුවන බලපෑම්වල වින්දිතයන් බවට පත් වීමට කම්කරු ප්‍රජාවට නිරන්තරයෙන් ඔවුන්ට ඔවුන්ගේ රැකියා පවා කැප කිරීමට භුක්ති විඳි අයිතීන් කප්පාදුවට ලක් කිරීමට පවා පාලකයින් කටයුතු කළේය. වෘත්තීය සංගම්වල අයිතිය සෞඛ්‍යය ආරක්ෂාව පවා නොලැබ යහපත් ජීවන වටපිටාවන් ජීවත් වීම සරිලන වැටුප් ඔවුන්ගේ සිහින ලෝක තුළම පාවී තිබුනා මිස ඔවුන්ට සාධාරණය ඉටු කිරීමට පාලකයින්ගේ ඇස් ඇරුනේ නැත.

සංක්‍රමණය වීම තුළ විඳින්නට සිදුවන අක්‍රමිකතා, හුදකලා වීම්, ප්‍රචණ්ඩත්වය, හිංසනය මවන්නේ ජීවන රටාවේ මූලික තැන බවට පත්විය. දීර්ඝ වැඩ සමග රැකියාවේ නියලීමටත් ගැටලුවලට පිළියම් සෙවීමටත් සිදු වීම නිසා බහුතරයක් දෙනාට දුෂ්කරතාවන්ට මුහුණ දීමට සිදුවිය. විවාහක කාන්තාවන්ට තම දරුවන්ගේ අධ්‍යාපන, සෞඛ්‍ය සඳහා

2 වන පිටුවට...

## ඇතුළු පිටු


02 පිටුව - කතු වැකිය / 41 වන වසරක ගමන් මග

03 පිටුව - සිතුවිල්ල

04-09 පිටු - සුභාශිංසන

10-11 පිටු - අපේ වැඩ

12 පිටුව - වසරක ගමන් මග

## ඩාබිඳු සාමූහිකය

වෙළඹඩ පාර, කටුනායක
දුර : 011 4 851 383
ඊ. මේල් : dabindu.infoco@gmail.com
Facebook : Dabindu Collective Sri Lanka

# ශ්‍රමයේ තීව්‍රතාවය අගයමු

ආර්ථික සංවර්ධන ක්‍රියාවලියට ඇතුළත් වූ පළමු රටවල් අතරින් ලංකාව ප්‍රමුඛ පෙළේ රටක් ලෙස හැඳින්විය හැක. ඒ අනුව යමින් IMF ණය ගනුදෙනුවලට 1956 කාලයේදීම හසු වූ රටකි. එසේම කාර්මීකරණයට යොමු වීමත් සමඟ දිගු ඉතිහාසයක් තිබූ නමුත් අද වන විට ලෝකයේ අඩුම වැටුප් ලබන රටක් බවට පත්ව ඇත. එසේම නිෂ්පාදනයේ ඵලදායීතාවය හා වැටුප් සලකා බැලීමේදී ඇමරිකාවට වඩා වැඩි කාර්යක්ෂමතාවයකින් එකම තාක්ෂණය භාවිත කොට සේවය කළත් ඉතාමත් ඉහළ අගයකින් එනම් 40%ක වැටුප් ගෙවීමක් ඇමරිකාව තුළ දක්නට ලැබේ. ඒ අනුව ලංකාවේ කම්කරුවන්ට බිලියන අටක වැටුප් අහිමි වීමක් තිබේ. මේ ගැන අප කලාපීය වශයෙන් සැලකිල්ලට ගෙන ජීවන තත්ත්වයන් පිළිබඳ ඵලදායි සංවාදයක් ඇති කළ යුතුය.

කම්කරු පාර්ශ්වයේ නිරන්තරයෙන් හාම්පුතාගේ අවශ්‍යතාවය සපුරාලීම පිණිසම භාවිත වන ක්‍රමවේදයක් දක්නට ලැබෙන අතර ඔවුන් හැම තිස්සේම නුපුහුණු ගණයේ සේවකයින් බවට පත්වේ. තාක්ෂණය යොදා ගැනීම ඵලදායිතාව සම්බන්ධයෙන්ද "ඔටෝමේෂන්" තත්ත්වයන් පවා භාවිත කළත් නව තාක්ෂණය හරහා කම්කරුවන්ගේ ඵලදායිතාවේ වර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කොට නැත. එකම අංශයක කිසිදා උසස් වීමක් නොමැතිව රැකියාව පිළිබඳ කිසිදු තෘප්තිමත්භාවයක් නැතිව කටයුතු කරයි. මේ නිසාම නිතරම ඇඟලුම් ක්ෂේත්‍රයේ රැකියා හැරයාමේ අගය ඉහල තත්ත්වයන් පෙන්නුම් කෙරුණි. එසේනම් ක්ෂේත්‍රයේ ඉදිරි මඟ වෙනුවෙන් ගෝලීය තාක්ෂණය යොදා ගනිමින් අපේම වූ ආර්ථික ආකෘතියක් සකසා ගත යුතුවේ. මෙහිදී ජාතික මට්ටමින් මිලදී ගැනීමේ ක්‍රය ශක්තිය ගණනය කිරීමටද රටේ ප්‍රාග්ධනය ඉවතට ගලා යාම පිළිබඳව දැඩි ලෙස තීන්දු ගැනීම සම්බන්ධව ද අවධානය යොමු කළ යුතුව ඇත. එසේ නොවන නිසා ඩොලර් බිලියන ගණනින් අපට මුදල් අහිමි වී ඇත. මේ තත්ත්වයන්ට සෘජුව බලපාන කාර්මික ප්‍රතිපත්තියක් නොමැතිකම ද, බැංකු පෞද්ගලීකරණය කිරීමද බලපා ඇත.

කම්කරු නීති ප්‍රතිසංශෝධනය කිරීමට අවැසි බව පවසමින් කටයුතු කරන්න උත්සාහ ගත්ත ද එසේ කම්කරු නීති වෙනස් කරනවා නම් කම්කරුවන් භුක්ති විඳි නීතිවලට වඩා උසස් තත්ත්වයන් යටතේ එම නීති ක්‍රියාත්මක කළ යුතුය. අර්ථසාධක අරමුදල වැනි එකම සමාජ ආරක්ෂණයන්ට බදු ගසමින් ඔවුන්ගේ අනාගතයට ඇති එකම ඉතුරුම් මුදල් රටේ ණය පියවීමට භාවිතා කිරීම ප්‍රජාතන්ත්‍රවාදී මුහුණුවරක් නොවේ. ඒ නිසාම විනිවිද භාවයෙන් යුක්ත වූ නීති රාමු හඳුන්වාදීමට රජයේ වගකීම වේ. එසේම ඒ සඳහා කම්කරු පාර්ශ්වයන් නියෝජනය කරන සංගම් ඒකරාශී කර ගැනීමට ද තීන්දු ගැනීමේදී කාන්තාවන් ඒ තුළට ඇතුළත් කර ගැනීමටද වග බලා ගත යුතුවේ.

1 පිටුවෙන්... **41 වන වසරක ගමන් මඟ...**

අවැසි පහසුකම් සපයා ගැනීමට වෙහෙස වන්නට සිදුව ඇත. එකම නිවාඩු දිනවන ඉරුදින රාජ්‍ය ආයතන වසා ඇති නිසා ඔවුන්ට ඒ සඳහා ඇති ඉඩකඩ අහුරා ඇත. පෞද්ගලික මට්ටමින් ඒවා සපුරා ගැනීම සඳහා වැඩිපුර වියදම් දැරීමට සිදුවේ. ප්‍රදේශය තුළ ලියපදිංචි නොවීම නිසාම තවත් ගැටළු රාශියක් ඔවුන්ගේ ජීවිතවලට එකතු වී ඇත. සුරැකුම් වැඩ සමග ඇයට දවසේ වැඩි කාලයක් ඒ වෙනුවෙන් වෙන් කරන්නට සිදුව ඇති නිසාම අවිවේකී බව දරාගන්නට නොහැකි වී ඇත.

ඩාබිඳු ඉහත කරුණු කාරණා සැලකිල්ලට ගනිමින් අදාළ ව්‍යාපෘති ඊට සමගාමීව සකස් කිරීමට කටයුතු කළෙමු. ඒ අනුව ජීවන වැටුපක් දිනා ගැනීමේ ක්‍රියාවලීන්ට, සන්නාමකරුවන් කේවල් කිරීමට ප්‍රජනන සෞඛ්‍ය අයිතිවාසිකම්, වෘත්තීය අයිතීන්, ජීවත් වන වටපිටාව, පාර්ශවකරුවන් සමග සංවාද, ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ, දැනුවත් කිරීම්, පුහුණු වැඩසටහන් උපාය මාර්ගිකව සැලසුම් කළෙමු. ඒ අනුව සිඩෝ සමාලෝචනයන්ට ඡායා පිටපත් සකස් කිරීම, කම්කරු උපදේශන සභාව නියෝජනය කිරීම, මානව හිමිකම් කොමිසමේ සමාජ ආර්ථික උප කමිටුව නියෝජනය කිරීම, ස්ත්‍රී පුරුෂ සමාජභාවී මණ්ඩපයන් නියෝජනය කිරීම තුළ යහපත් සේවා පරිසර නිර්මාණය කිරීමෙහිලා ක්‍රියාකාරී දායකත්වයක් සැපවූවෙමු. පොදු කුස්සිය, උපදේශනය, එක් දින වෛද්‍ය සායන, ඖසප් දරිද්‍රතාවය පිළිබඳ අප පසුගිය වසරේ අවධානය යොමු කළ විශේෂ දිශානතීන් වේ. එසේම උතුරු ප්‍රදේශයේ කර්මාන්තශාලාවල සිදුවන අක්‍රමිකතා මැඩ පැවැත්වීමට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සමඟ නිරන්තර සාකච්ඡා, නීති ආධාර ලබාදීම අපගේ වැඩවල සැලකිව යුතු ප්‍රමාණයේ සාර්ථකත්වයක් පිළිබිඹු කරයි.

ඇමෙරිකානු බදු ප්‍රතිපත්තීන් නිසා කර්මාන්තකරුවන් කම්කරුවගේ රැකියා සුරක්ෂිතභාවය අවධානමකට ලක් කරයි. ප්‍රධාන පෙලේ කර්මාන්තශාලා හිටි හැටියේ වසා දමයි. සේවකයන්ගේ අනාගතය පිළිබඳ බිය මතු කරමින් අනාරක්ෂිත සේවා පරිසර වෙත යොමු කිරීමද, කොන්ත්‍රාත් සේවාවන් සඳහා යොමු වීමට ද බලපෑම් කරයි.

අත්‍යවශ්‍ය භාණ්ඩ මිල ඉහළ යාම, බදු ගැසීම වැනි කාරණා නිසා මාසික වැටුප ඔවුන්ගේ මූලික අවශ්‍යතා සපුරා ගැනීමට ප්‍රමාණවත් නොවේ. වාර්ෂික වැටුප් වැඩි වීම ජීවන වියදමට නොගැළපෙන නිසා බදු ඉවත් කිරීම් තුළින් සේවකයින්ට සහන සැලසීමට කටයුතු කළ යුතුය. නව රජය යටතේ අය වැය සහන දීමනාව කප්පාදු කළ නිසා ණය සේවකයින්ගේ දෛනික ජීවිත වලට තවත් බලපෑම් ගෙන දෙයි.

ගෞරවාන්විත රැකියාවක්, ගෞරවාන්විත ජීවිතයක් වගේ ම තෘප්තිමත් රැකියාවක් කම්කරුවන්ට උදාකර දීම වගකිව යුත්තන්ගේ වගවීම වේ. අනෙකුත් රටවලට සාපේක්ෂව අඩුවැටුප් ලබන වැඩි කාර්යක්ෂමතාවයකින් සේවය කරන කම්කරුවන්ගේ වෘත්තීය අයිතීන් සුරැකීමට වග බලා ගැනීම අප සියලුදෙනාගේ එකමුතුකමේ ප්‍රතිඵලයකි. ඒ නිසා වැඩ කරන පංතියේ අයිතිය සුරැකීම වෙනුවෙන් අප සදා අත්වැල් බැඳගන්නෙමු.



# ගෞරවාන්විත රැකියාවක් උදෙසා

ජාත්‍යන්තර කම්කරු සංවිධානය හඳුන්වා දෙන ලද ගෞරවාන්විත වැඩ පිළිබඳ සංකල්පයේ ඵලදායී, සමානාත්මතාවයෙන් යුත්, සාධාරණ රැකියාවකට මූලිකාංග හතරක් වේ.

පළමුව, රැකියා උත්පාදනයයි. එනම්, සැමට වැඩ කිරීමට සහ සාධාරණ ආදායමක් උපයා ගැනීමට අවස්ථා ප්‍රවර්ධනය කරන රැකියාවක්. මේ යටතේ ව්‍යවසායකත්වය, කුසලතා සංවර්ධනය සහ තිරසාර රැකියා උත්පාදනය කරන රජයේ සහ සේවා ප්‍රතිපත්ති වර්ධනය කරන රැකියාවක් ගෞරවාන්විතයි.

දෙවනුව, රැකියා ස්ථානයේ අයිතිවාසිකම් තහවුරු කිරීමයි. ඒ අනුව රජයටත්, ආයතනවලටත් සංගමයේ නිදහස, සාමූහික කේවල් කිරීම සහ, වෙනස්කම් කිරීම්, බලහත්කාර ශ්‍රමය සහ ළමා ශ්‍රමය ගැනීම් වලින් ආරක්ෂා කිරීම ඇතුළුව සේවකයින්ගේ මූලික අයිතිවාසිකම් සහතික කරන රැකියාවක් ගෞරවාන්විත වේ.

තෙවනුව, සමාජ ආරක්ෂණය. කම්කරුවන්ට සෞඛ්‍ය සේවා, විශ්‍රාම ප්‍රතිලාභ සහ විශ්‍රාම වැටුප් සඳහා ප්‍රවේශය වැනි ආරක්ෂණයන් සැපයීම, සේවකයින් සහ ඔවුන්ගේ පවුල් ආර්ථික හා සමාජීය අවදානම් වලින් ආරක්ෂා වන බව සහතික කරන රැකියාවක් ගෞරවාන්විතයි.

සිව්වෙනුව, සමාජ සංවාදයයි. කම්කරු ගැටළු සම්බන්ධයෙන් එකඟතාවයක් ගොඩනගා ගැනීමට සහ සාධාරණ හා ඵලදායී සේවා ස්ථාන පිළිවෙත් ප්‍රවර්ධනය කිරීමට රජයන්, සේවා යෝජකයින් සහ සේවකයින් අතර විවෘත සාකච්ඡාව දිරිමත් කරන රැකියාවක් ගෞරවාන්විත වේ.

ඔබ නියැලෙන්නේ මෙසේ නිර්වචනය වූ ගෞරවාන්විත රැකියාවකද? ගෞරවාන්විත රැකියාවක් කියන්නේ කුමක්ද? ඔබේ රැකියාව ගෞරවාන්විත වීමට නම් තිබිය යුතු කුමක් දැයි සිතා බලන්න.

පෞද්ගලික අංශයෙන් 4% ක් පමණක් වෘත්තීය සමිතිගත වී සහ සාමූහික ගිවිසුම් ඇති රටක, ගෞරවාන්විත වැඩ යනු ගෞරවය, යුක්තිය, සමානාත්මතාවය සහ සහභාගීත්වයයි. මේවා සැබෑවන සේවාස්ථාන ප්‍රජාතන්ත්‍රවාදයේ කුළුණු වේ. ඒ අනුව ඔක්තෝබර් 7 වන දිනට යෙදී ඇති ගෞරවාන්විත වැඩ දිනයේදී, අපි යළි තහවුරු කරන්නේ සරල සත්‍යයකි: සියළු කම්කරුවන්ට සාධාරණ වැටුප් සහ ආරක්ෂාව පමණක් නොව, සාමූහික තීරණ හරහා ඔවුන්ගේ ජීවිත හැඩගස්වන ප්‍රජාතන්ත්‍රවාදී වැඩ ලෝකයක් ද සහතික විය යුතුය.

# සිතුවිල්ල

වැඩ ඇරිලා එන ගමන් පොළට ගියා. එළවළු දෙක තුනක් ගත්තා. ගඩු ගුඩා, රඹුටන්, දූරියන්, මැංගුස් පිරිලා තිබුණා. අතේ සල්ලි මදි නිසා ගඩු ගුඩා රු.100ක ගත්තා. බෙදාගෙන කන්න... අපේ බෙසට් එක එහෙමයි. මැරිලා මැරිලා පොළට ගියෙත් හරිම අමාරුවෙන් දැන් ටාගට් එක දුන්නේ නැත්නම් කෙළින්ම එළියේ. ටැරිෆ් කියයි, IMF කියයි, ටැක්ස් කියයි. මොනා ආවත් අන්තිමට, අපේ හිඟන පඩියට, අපේ රස්සාවට වැට බඳින එකක් තමයි. නැවත වතාවක් කම්කරු නීති හදනවලු. අනේ පිං සිද්ධ වෙයි තිබුන නීති වෙනුවට අලුත් නීති ගේනවනම්, අපි භුක්ති විඳපු නීති වලට වඩා ගුණාත්මක එකක් විය යුතුයිනේ. ඒ ගැන බලධාරීන්ගේ අවධානයට ගන්න ප්ලීස්. රස්සාවේ හෙට ගැන කලකිරීමෙන් පයින් එද්දි හිතුනා ටුක් එකක නගින්න තිබුනනම් කියලා. අපිට කොයින්ද බූල් බල්ලෝ. වාහන තදබදය මැද්දෙන් බෝඩිමට ආවා. සුරංගි කෝ කියලා බලද්දී ඒකි මල් කඩනවා. මටත් ඇඳට පැනලා මහන්සි අරින්න හිතුනා. ඒත් රෑට කන්න උයන්න ඕන නිසා තේ එකක් බොන්න කේතලය ලිප තිබ්බා.

වැඩ ඇරිලා එද්දීම හිතෙන්නේ කඩෙන් මොනවහරි ගෙනත් කන්නමයි. ඒත් කෝ සල්ලි. වැඩපලේ දෙන කෑම එක ගැන කතා නොකර ඉමු. 2014 දී ආයතනයෙන් දීපු කෑම එකක් කාලා ජීවිතය අහිමි වුණු නඩුවක් ගැන එදා වැඩසටහනට ගියාම එයාල කිව්වා. දැන් අවුරුදු 11ක් ලු. කිසිඳු වන්දියක් නැලු. මොන නීති හැදුවත් අපිට සාධාරණයක් වෙන්නේ නෑ. අපෙන් වැඩ ගන්න, අපිට සත්තුන්ට වගේ බනින්න, උපයාගත් නිවාඩු නොදෙන්න මෙයාල හරි දක්ෂයි. හිත හිත ඉඳලා තේ එකත් නිවිලා. උගුරට දෙකට බීලා උයන්න ගත්තා. ටෙලියක් බලන්නවත් විවේකයක් නෑ.රටේ ලෝකේ මොනවා වෙනවද කියලා හොයන්න වෙලාවක් නෑ. ෆෝන් එකට එන මැසේජ් එකක් විතරයි. ඒකෙත් තියෙන්නේ ඕපේ. AI කියයි. බලන්නකෝ තාක්ෂණය අපිව පාලනය කරන හැටි. ඔටෝ මේෂන් කියලා වැඩ ගන්නවා. අපේ ඇඟිලිත් අහු වෙනවා. කිසිම සාධාරණයක් නෑ. AI වලින් අපිට මොනා කරයිද දන්නේ නැහැ. අකුළාගෙන යන්න සිදුවෙච්ච දාට තමයි තරු විසිවෙන්නේ. ඇඟලුම් කිව්වට මහන්න දන්නේ එක කැල්ලක් විතරනේ. ගමට ගිහින් කුඹුරක් කොටාගන්නවත් කෝ හයියක්. සිතුම් පැතුම් පැත්තකට විසි කරලා නාගන්න ගියා පෝළිම අඩු නිසා.

සමන්තා

# ඩාබිඳු 41 වන සංවත්සර සුබපැතුම්




Congratulations again on the 41st anniversary of Dabindu Collective! This milestone reflects a sustained commitment to advancing women's rights, empowering women workers, and building resilient communities across Sri Lanka. Your work in Katunayake, Biyagama, Vavuniya, Kilinochchi, and beyond is inspiring, and the branches you've established demonstrate meaningful growth and impact.

I'm honored to share my greetings and best wishes as you celebrate this special year. May the organization continue to flourish, expand its reach, and strengthen its positive influence for women workers nationwide.

**Best Regards**
**Indrani Kusumalatha**
**Executive Director**
**Community Encouragement Foundation - CEF**

ඇත්තෙන්ම ඩාබිඳු සාමුහිකය මෙතෙක් කරනා ලද සේවය ඉතා අගයමු. එහි නිර්මාතෘ සමන්මලී මහත්මිය ගත් වෙහෙස මල් එල දැරීමට වෙහෙස වූ වත්මන් අධ්‍යක්ෂිකා චමිලා මහත්මියට අප සංවිධානයේ ආචාරය මෙසේ පුද කරමු. ඉදිරිය කෙසේ වේවිද? ඒ යන ගමනේ ගිරිදුර්ග, හැලහැප්පිලි, විවේචන සේම සුභාසිරිද එකසේ ලැබේවි. නමුත් ඩාබිඳු යන බව ස්ථිරයි එදිරියට. අපේ පැතුම එයයි. ජයවේවා.

**අපි කුසුම් සිල්වා ප්‍රමුඛ ගම්පහ දිස්ත්‍රික්කයේ පුරවැසි කමිටුව මානව හිමිකම් සංවිධානය**

## ඩාබිඳු සාමුහිකය මේ වසරේ සමරන 41 වන සංවත්සරයට අපගේ උණුසුම් සුබ පැතුම්!

41 වන සංවත්සරය සමරන ඔබගේ ගෞරවනීය කාන්තා සංවිධානයට ප්‍රථමයෙන් අපගේ හෘදයාංගම සුබ පැතුම් එක් කරන්නෙමු!

නිදහස් වෙළඳ කලාපවල කාන්තාවන් වෙනුවෙන් දශක හතරකට අධික කාලයක් පුරා ඔබ ගෙන ගිය නිරන්තර කැපවීම, ධෛර්යය, සහ එකමුතුව ඉතාම අගනේය.

ජයග්‍රාහී දිනවලත්, දුෂ්කර දිනවලත්, ඔබේ නායකත්වය සහ කැපවීමෙන් කටයුතු කිරීම මෙන්ම කාන්තා අයිතිවාසිකම්, සාමය සහ සාධාරණය උදෙසා කටයුතු කරමින් ගෙවූ වසර ගණන ඉතා අරුත්බරය.

අනාගතයේදීත් ඔබ සංවිධානය තව තවත් ශක්තිමත් වී, කම්කරුවන් වෙනුවෙන් අර්ථවත්, දිගු ගමනක් යන්නට අපි ඩාබිඳු සාමුහිකයට ආශීර්වාද කරන්නෙමු!

**චන්ද්‍රා දේවනාරායන ඇතුළු**
**RED කාර්ය මණ්ඩලය.**

ඩාබිඳු සාමුහිකය ශ්‍රමාභිමානී අපට වැදගත් වන්නේ නිරන්තරයෙන්ම ඔබ කම්කරු කාන්තාවන්ගේ පීඩිත හඬට ඉඩක් සලසාදීමට ගන්නා වු උත්සාහයයි.

ඕනෑම අවස්ථාවක අභියෝගයක් වෙමින් පාලකයින් සහ කම්කරුවන්ට අහිතකර තීරණවල දී ඔබගේ හඬ අවදි කරන්නේ නොබියවය.

පුවත් පතක් ලෙස ඔබ ආරම්භ කළ ගමන් මග එතනින් නොනැවතී කම්කරුවන් අතරට යමින් ඔබ දැනුවත් කිරීමට මෙන්ම සංවිධානය කරමින් කම්කරුවන් ඔවුන්ගේ අදහස් සහ සිතුම් පැතුම් වලට අරුතක් එක් කරන්නට ගන්නා වූ උත්සාහයට සුභ පැතුම් එක් කරන්නේ හදපිරි සතුටිණි.

**ශ්‍රමාභිමානී කේන්ද්‍රයේ සුගත් රාජපක්ෂ ඇතුලු සියලු කාර්යය මණ්ඩලය**



නිදහස් වෙළඳ කලාපයේ දිරිය කාන්තාවන් සඳහා අඛණ්ඩව වසර 41ක් පුරා ඩාබිඳු සංවිධානය විසින් සිදු කල අනගි සේවය වෙනුවෙන් සුභාශිංසනය එක් කරනවා. ඉදිරියටත් මෙවැනි වටිනා සේවාවක් කිරීමට ලැබේවා කියා ප්‍රාර්ථනා කරමි.

I congratulate the Dabindu organization for its 41 years of continuous service to the brave women of the Free Trade Zone. I hope that it will continue to provide such valuable service in the future.

**Vincent Fernando**
**Manager**
**Sri vimukthi fisher women organization**



# ඩාබිඳු 41 වන සංවත්සර සුබපැතුම්



### *My Warmest Greetings on Dabindu Collective's 41st Anniversary*

It is with deep respect and heartfelt admiration that I extend my warmest congratulations to all of you on this remarkable milestone. Through your tireless advocacy, transformative training, and strategic partnerships, you have empowered Free Trade Zone women workers and amplified their voices in critical decision-making spaces. Dabindu Collective is a pioneering force in advancing women's labour rights and social justice across Sri Lanka.

This tribute honours the creativity, resilience, solidarity, hard work and unwavering commitment of the Dabindu team.

Wishing you all more power and momentum to continue, innovate, break boundaries and champion the labour rights agenda where every woman worker can thrive with dignity and purpose.

**With pride and solidarity,**
**Kalani**

41 වන වසරට පා තබන ඩාබිඳු සාමූහිකය සංවිධානයට මා හදවතින්ම සුබ පතමි. අපගේ ජීවිතයේ සෑම ප්‍රශ්නයකටම මෙම ආයතනයේ පවත්වන වැඩසටහන් තුළින් දැනුම ලබා ගන්නට ලැබීම අගය කොට සලකමි. මෙම ආයතනය දිනෙන් දින දියුණු වේවා කියා මා හදවතින්ම සුබ පතමි.

**ඒ. සුනේත්‍රා කුමාරි - කටුනායක**

41 වෙනි සංවත්සරය සමරන ඩාබිඳු සාමූහිකයට සුබ පතමි. මෙතෙක් කරන ලද වැඩසටහන් වලින් අපි ගොඩක් දේවල් ඉගෙන ගත් අතර තවදුරටත් මෙවැනි වැඩසටහන් කිරීමට ශක්තිය, ධෛර්යය ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරමි.

**නිලූකා අයිරාංගනී - කටුනායක**

## මගේ මිණි පහන ඔබයි

ඩාබිඳු සැදුනා කඳුලැල් සැලුනා සිත කිසි විට නෑ හැඬුවේ...

මෙතෙක් ආ මග දිරිය ශක්තිය දුන්නේ ඔබයි මව්නේ...

41 වෙනි සංවත්සරය අත්වැල් බැඳගෙන සමරමු අපි සෙනෙහේ සිතින්...

**ඩාබිඳු මාතාවන් චිරාත්කාලයක් වැජඹේවා කියා සුබාශිංසන එක්කරන මා රෝෂිනී වීරසිංහ**



41 වෙනි උපන් දිනය සමරන ඩාබිඳු මාතාවට හදවතින් බොහෝම ස්තූතියි. මෙතෙක් අපහට ලබා දුන් දැනුම හා ශක්තිය ලබා දීම ගැන බොහෝම ස්තූතියි. තව දුරටත් මෙවැනි වැඩසටහන් කර ගැනීමට දිරිය ශක්තිය ලැබේවා කියා මා ප්‍රාර්ථනා කරමි. කම්හලේ යකඩ මැෂින් ගොඩකට යට වී මානසික පීඩනයකින් තොර සැනසීමක් සතුටක් නොමැති මේ කටුක ජීවිතයට අරුණැල්ලක් වූ ඩාබිඳු සාමූහිකයට සහ අපට ලබා දෙන දිරිය ශක්තියට බොහෝම ස්තූතියි.

**එච්.ජී. නිර්මලා කුමාරි.**



41 වන ජන්ම දිනය සමරන ඩාබිඳු සමූහික ආයතනයට මගේ හදපිරි ස්තූතිය.

අපගේ දැනුම වර්ධනය කර ගැනීමට උපකාර කරන ඩාබිඳු සාමූහික ආයතනයට ශක්තිය ධෛර්ය ලැබේවායි පතමු.

**එච්.ඒ.එස්. සංජීවනී - කටුනායක (කෑගල්ල)**

ඩාබිඳු සාමූහිකයට වසර 41ක් ගත වීම නිමිත්තෙන් සුබ පැතුම් එක් කරමි. කාන්තාවන් සඳහාම වෙන් වූ ඩාබිඳු, කාන්තා වැඩමුළු පැවැත්වීම පිළිබඳ ස්තූති කරමි.

**කටුනායක - නිලූකා**

# ඩාබිඳු 41 වන සංවත්සර සුබපැතුම්

## “මුර කාවල් නැති වැටකොටු බැමි නැති අපේම අපේම නවාතැනක්”

පුරා වසර 41 ක් තිස්සේ නිදහස් වෙළඳ කලාප ආරම්භයේ සිටම කම්කරුවාගේ දුක කඳුල සුසුම වේදනාව හරයටම අවබෝධකරගත් ඔබ, සංවිධානයේ ආරම්භ කරමින් මේ දක්වාම සේවක සහෝදර සහෝදරියන් වෙනුවෙන් පෙනී සිටින එහි නිර්මාතෘ සමන්මලී මහත්මියට නිදුක් නිරෝගී සුවය හෙබි කම්කරුවන්ට තවදුරටත් සේවය කරන්නට හැකියාව ලැබේවා යයි මා මුලින්ම ප්‍රාර්ථනා කරනවා.

ඇය නොසිටින්නට ඩාබිඳුවක් නිර්මාණය නොවන්නට තිබුණි. මේ වන විට ඩා බිංදුව ගඟක් වී ඇත.

එතරම් ජන ගඟකට සරණ වන්නට හැකියාව ලැබී ඇත්තේද මේ මොහොත වනතුරුම නොසැලී මෙය ඉදිරියට ගෙන යන්නට පන්නරය ලබා දුන් සහ ඉදිරියටත් නායකත්වය ලබා දෙන චමිලා තුෂාරි මහත්මියගේ නායකත්වය නිසාය.

ඇය විටෙක තම අධ්‍යක්ෂක මණ්ඩලය/ කාර්යය මණ්ඩලය මෙන්ම අනිකුත් සහෝදර ආයතනවලට සහෝදරියකි, යෙහෙළියකි, මවකි, කා අතරත් ජනප්‍රිය ඇය චමිලා, හිනාමුසු මුහුණින් තම ශක්තිය හා සහෝදරත්වයෙන් මේ තරම් දුර නිහතමානීව ගමන් කරන්නට හැකි වන්නේ ඇයගේ නායකත්වයේ ඇති නිම් නොවන මනුෂ්‍යත්වය නිසාමය.

ආරම්භයේ රාජ්‍ය නොවන සංවිධානයක් වුවත් වෘත්තීය අයිතීන් උදෙසා සටන් කරන හැම තැනකම ඩාබිඳු පෙනී සිටීම අරුමයක් නොවේ.

මේ වන විට ඩාබිඳු වෘත්තීය සමිතිය සේවක අරගල වලට දක්වන සහය සේවක සේවිකාවන් හොඳින් දනී.

සංවිධානය නොවූ පිරිස් සංවිධානය කිරීමට ඔබගේ කාර්ය මණ්ඩලය ගන්නා උත්සාහයට මා ආචාර කරමි.

සේවක සේවිකාවන්ගේ ප්‍රශ්න හැම පැතිකඩකින්ම දකින ඔබ විශේෂයෙන්ම කාන්තාවන්ගේ සෞඛ්‍ය පිළිබඳව් සුවිශේෂී මෙහෙවරක් කරමින් ඇයගේ යකඩ ඌනතාවය ගැන යකඩ ගැහැණියක් ලෙස ආමන්ත්‍රණය ඔබ චමිලා මගේ හද පැතුමන් ඔබ සැමට.

විශ්‍රාම වැටුප් අරගලය එයින් දිවි අහිමි වූ රොෂාන් චානකට යුක්තිය/ තනි කම්කරු පනත/ කොවිඩ් - 19 වසංගතය වැනි කම්කරුවන්ට පොදු ගැටලු වලදී ඔබ සංවිධානය කම්කරුවාගේ සෙවනැල්ලක් මෙන් අනිකුත් සංවිධාන සමඟ ගෙන යන අරගල ඉල්ලන යුක්තිය මුළු මහත් කම්කරු ප්‍රජාවටම ශක්ති ඩාබිඳු කටුනායක මෙන්ම බියගමත් සේවක සේවිකාවන්ට විවෘතව තිබීමත් ඔබගේ සේවාවන් පුළුල් කිරීමෙන් සේවක ප්‍රජාවට අසීමාන්ත සේවාවන් රැසක් ඉටුවන බව නොරහසකි.

ඩාබිඳු සංවිධානයට ජයෙන් ජය පතන්නෙමු.

**ඒකවත්තාලිස වස්සං සුඛං හේතු**
**(හතලිස් එක් වර්ෂය සුබ වේවා)**
**නෙලුම්මලී දේවසිංහ**

## ඔබගේ අධිෂ්ඨානය දිනේවා!

කාන්තාවන් ශක්තිමත් වූ විට සමාජය සම්පූර්ණයෙන්ම ශක්තිමත් වේ.

ඩාබිඳු සාමුහිකය ඇඟලුම් කර්මාන්තයේ සේවයේ නියුතු කම්කරු කාන්තාවන්ගේ අයිතිවාසිකම් හා පොදුවේ සියලුම කාන්තාවන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් අඛණ්ඩව ක්‍රියාත්මක වෙමින් පහුගිය වසර 41 ක් පුරා නියෝජනය වෙමින් කාන්තාවන් සවිබල ගැන්වීම දක්වා අභියෝගාත්මක ගමණක් පැමිණ ඇත. මෙම ගමන අඛණ්ඩ අරගලයකි. මෙම දිගු ගමන තුළ කම්කරු අයිතිවාසිකම් මෙන්ම කාන්තා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම හා සමාජ සංවර්ධනය සඳහා මහගු දායකත්වයක් ලබා දෙමින් සියලුම ජනවර්ගවල කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා කැපවෙමින් වඩාත් සාධාරණ සමාජයක් සඳහා ක්‍රියාකාරි දායකත්වයක් ලබා දී ඇත. මෙම දිගුගමන සැමරුමට අපගේ හෘදයාත්මක සුභ පැතුම් මෙසේ එක් කරමින් ඔබගේ ආදරය, අරගලය සහ කැපවීම ඉදිරියේ තව තවත් කාන්තාවන්ගේ ජීවිත ආලෝකමත් වේවා.අධිවේගි මග නොව අයිතිවාසිකම් සුරැකි සමාජයක් ගොඩනගන ඔබගේ අධිෂ්ඨාණය දිනේවා.

**වසන්ත කුමාර.**
**සභාපති**
**ප්‍රජා සහෝදරත්වය සංවිධානය**
**වෙනුවෙන්**



# ඩාබිඳු 41 වන සංවත්සර සුබපැතුම්

41 වෙනි ඩාබිඳු මාතාවට හදවතින්ම බොහෝම ස්තූතියි. මෙතෙක් අපහට ලබා දුන් දැනුම හා ශක්තිය ලබා දීම ගැන බොහෝම ස්තූතියි. තව දුරටත් මෙවැනි වැඩසටහන් කර ගැනීමට දිරිය ශක්තිය ලබා දෙන මෙන් ඩාබිඳු සාමූහික ආයතනයට හදවතින් බොහෝම ස්තූතියි. හැන්දෑවෙ ගෙදර දුවලා

රෑ දෙගොඩහරිය මගේ දුක් යහන
මත්තේ දපලා
හිමි සඳුගෙ ගිණිත් නිවලා
අඩ නින්දෙ අඩක් ගෙවලා
නැගිටලා හිරුට කලියෙන් ගෙයි
උදේ මෙහෙය නිමවා...

ඩාබිඳු සාමූහික ආයතනයට බොහෝම ස්තූතියි.

**ක්‍රිශාන්ති - බණ්ඩාරවෙල**

Warm greetings to all the members of Dabindu Collective on its 41st Annivesary. Over 4 decades of your existence is a testament of your resilience and impact among workers. I wish Dabindu Collective the best in the coming years ahead and hope you that you continue your great work and commitment to justice, fairness, inclusion in a real sense and empowerment of all workers.

**Manoranjan Pegu, PhD**
**Country Program Director**
**Solidarity Center**



வருடங்கள் பல ஓடினாலும் உனக்கு வயதாகவில்லையே நீ பூமியில் வீர நடைபோட்டு இலங்கையை வலம் வருகின்றராய் டாபிந்து உன்அருமை புகழ் பாட ஓடோடி வந்தேன் நானும் பல பெண்களுக்கு நீ ஆதரவு வழங்கினார் இன்னும் பல பெண்களுக்கு கல்வி அறிவை எனும் ஒளியை ஏற்றினாய் தந்தையை இழந்த பிள்ளைக்கு தந்தையாய் தத்தெடுத்து வளர்த்தாய் மனதிற்க்கு இதமான வார்த்தைகளை அள்ளி தந்து நீ நிழல் தந்த தாயானாய் உடலுக்கு நீ விணைகண்டு மருந்தானாய் மொத்தத்தில் உன் வயது 41 உன் சேவைகண்டு வியந்து நின்றேன் உன் சேவைகள் ஆலம் விழுது போல் விரிட்சம் கொண்டது உன் புகழ் பாட என் நாவில் வார்த்தைகள் இல்லை நீ வாழ்க உன் புகழை நான் பாட

**ளுளையசுரடில**
**ஏயளரெலைய**



வடக்கு வாசல் திறந்தது, எம் வியர்வைத்துளிகளைப் போக்க வியர்வைத்துளி எனப் பெயர்பெற்று எம்மை நாடி வந்தாய் - எண்ணிலடங்கா கருணை கொண்ட உமது அர்ப்பணிப்பிற்கு எம் தலைவணங்கி நன்றிகளைத் தெரிவிக்கின்றோம். உம் பெயரை இன்றுவரை காத்து, அதற்காக தம்மை அர்ப்பணித்து உழைக்கும் உம் தொண்டர்களாகிய டாபிந்து அலுவலகர்களின் பணிசிறக்க வேண்டுகின்றோம். இனிய 40வது பிறந்தநாள் வாழ்த்துக்கள்!!!

**டிலக்சனா - கிளிநொச்சி**



## 41 වන සංවත්සරය සැමරුම්

ඩාබිඳු ආයතනය අප වෙනුවෙන් ඉතාමත් කැපකිරීම් කරමින් වෙළඳ කලාපීය අප වෙනුවෙන් ඉතාමත් ශක්තියක් ලබා දෙන ආයතනයකි. මේ ලබා දෙන ශක්තිය වෙනුවෙන් මගේ හදපිරි ස්තූතිය පුද කරමි.

**ඩී.එච්.ඩබ්ලිව්. සඳුනි**

41 වන සංවත්සරය සමරන ඩාබිඳු සාමූහික ආයතනයට මාගේ ස්තූතිය පුද කර සිටිමි. කාන්තා අපගේ සියලු ප්‍රශ්න වලට සෑහෙන දැනුමක් ලබා දුන් ඔබට මම ස්තූති කරමි. ඔබගේ ආයතනය තව තවත් දියුණු වේවා.

**කාන්ති - කටුනායක**
**(කැබිතිගොල්ලෑව)**

ඩාබිඳු ගමන් මගේ ඉදිරිය සම්බන්ධව බලා සිටිමින් අතීතයේ සතුටට පත්වීමි. නායකත්වයේ නොපසුබට උත්සාහයට ආචාර කරමි. අනාගතයට සුබපැතුම් එක් කරමි.

**සිරිමල් පීරිස්**
**ජනතා සෞඛ්‍ය සන්සදය**

# ඩාබිඳු 41 වන සංවත්සර සුබපැතුම්



41 වන ජන්ම දිනය සමරන ඩාබිඳු සාමූහික සංවිධානයට මගේ හදපිරි ස්තූතිය පුද කරමි.

මෙමඟින් මා හට නොදන්නා දැනුමක් ලබා ගැනීමට මහත් රුකුලක් විය. ඔබගේ සටන අප වගේ කාන්තාවන්ට උපදෙස් ලබා දීමට තව තව ශක්තිය උපරිමයෙන් ලැබේවා. ඔබ ආයතනයට මගේ මුලු හදවතින්ම දිගාසිරි ප්‍රාර්ථානා කරමි.

**ආර්.ඩබ්ලිව්. ලසන්ති - කටුනායක (ගාල්ල)**



41 වන සංවත්සරික සැමරුම සමරන මේ මෙහොතේ කාන්තාවන් සඳහා තවත් මෙවැනි වැඩසටහන් කරගෙන යාමට ශක්තිය ධෛර්යය ලැබේවා කියා ප්‍රාර්ථනා කරමු.

**ප්‍රියංකා, රේණුකා - අනුරාධපුරය (ජයවර්ධනපුර)**

## Best Wishes!

It is with great joy and deep respect that I extend my heartfelt wishes to Dabindu Collective as you celebrate 41 years of tireless service.

For more than four decades, Dabindu Collective has stood as a strong voice for some of the most marginalized communities in Sri Lanka, particularly the workers in the Free Trade Zones of Katunayaka, Biyagama, and Kilinochchi. Working with FTZ laborers is never an easy task, but Dabindu has consistently taken up this challenge with courage, love, and commitment.

Your organization has been a true defender of labor rights—fearlessly engaging in advocacy and lobbying, challenging employers when needed, and always ensuring that workers are treated with dignity and fairness. At the same time, Dabindu has been more than an activist movement; it has been a home filled with love, care, and solidarity, keeping workers united and peaceful even during difficult times.

The guidance and leadership of Executive Director Ms. Chamila Thusari, together with the unwavering commitment of the dedicated staff, has made Dabindu a shining example of what it means to work with heart, vision, and resilience.

Personally, I have had the privilege of working very closely with Dabindu over the past 6–7 years. During this journey, I have not only witnessed but also experienced the organization's honesty, courage, and compassion. I hold Dabindu in great love and respect, and I deeply appreciate the remarkable work you continue to do for the laboring community.

On this special occasion, I share my warmest congratulations and best wishes. May Dabindu Collective continue its powerful journey of justice, advocacy, and solidarity for many more years to come.

**Anthony Jesudasan**
**Executive Director**
**Voice of the Plantation People Organization – VOPP**



# ඩාබිඳු 41 වන සංවත්සර සුබපැතුම්

## Dear Chamila and all the friends,

We are greatly appreciated your dedicated services for garment factory workers to protect their rights .

Also highly encourage you to continue the

assistance for the worker's .

We are happy convey our congratulations to you and your team.

**Wish you all the Best,**
**Warmest Regards,**
**Geetha Lakmini.**
**National Convener.**
**On behalf of the We Women Lanka Network.**



පුංචි පැළය සිටුවනවා
පුංචි පැළය දළුලනවා
පුංචි පැළය ලොකු වෙනවා
පුංචි අපිව රැක දෙනවා

සතුට සමගිය පිරුණු නිරෝගිමත් දිනකට පා තබන ඔබ, මා ඇතුලු සියලු දෙනාටම සෙත් සාදන ඩාබිඳු සාමූහිකයට හෙට දින දියුණුවෙන් දියුණු වේවා..!

**චිත්‍රා - කටුනායක**

අවුරුදු හතළිස් එකක් වූ ඩාබිඳු ආයතනය මඟින් මේ පවත්වනු ලබන වැඩසටහන් අපට ඉතාමත් වටිනාකමින් යුක්තයි ඒ සඳහා තවදුරටත් මෙම ඩාබිඳු ආයතනයට මේ වගේ වැඩසටහන් කරගෙන යාමට තවතවත් ශක්ති සම්පන්න වේවා කියා ප්‍රාර්ථනා කරනවා.

**ප්‍රබෝධා - කටුනායක (ගල්ගමුව)**



## කාන්තාවන්ට ශක්තියක් වූ ඩාබිඳු,

41 වසක් ආ මේ දිගු ගමනේ තව තවත් ඉදිරියට දිවයන්නට ශක්තිය ධෛර්යය ලැබේවා......

**ශිරාණි - කටුනායක (ගල්ගමුව)**

## චිරාත් කාලයක් වැජඹේවා!

ඩාබිඳු ආයතනයේ 41 වන ජන්ම දිනය සමරන ඔබලාට මාගේ හදපිරි ස්තූතිය පුද කර සිටිමි.

අප වගේ කාන්තාවන් හට ඔබ ආයතනයයෙන් කරනු ලබන මෙහෙය ඉතා වටිනා දෙයකි. අපගේ සියලුම ගැටලු වලට විසඳුම් ලබා දී අනගි දැනුමක් ලබා දුන් ඔබලා චිරාත් කාලයක් අප සමාජයේ වැජඹේවා.....!

**ඉන්දිකා - කටුනායක (කුරුණෑගල)**

**41 වන ඩාබිඳු සාමූහික සංවත්සරය**



කටුනායක වෙළඳ කලාපයේ රැකී රක්ෂාකරන අප වෙනුවෙන් වටිනා මෙහෙවරක් ඉටු කරමින් අපගේ ප්‍රශ්න වලට උත්තර හොයමින් අපිට දෙන ශක්තිය කැප කිරීමට මා මගේ හදපිරි ස්තූතිය ලබා දෙමි.

**කේ. සුමනාවතී - වීරකැටිය**

# ප්‍රාදේශීය සිවිල් සංවිධාන පාර්ශවකරුවන් අතර සාකච්ඡා





2025/08/12 දින ඩාබිඳු සාමූහිකය සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන් අතර සාකච්ඡාවක් කිලිනොච්චි සමූපකාර ශාලාවේ දි පවත්වන ලදී. මෙහිදී ගෘහස්ථ හිංසනය ළමා අපයෝජනය සහ පෝෂණ ගැටලු ඇතුලු කිලිනොච්චියෙ හි ස්ථාපිත කර්මාන්තශාලා දෙකෙහි සහ සේවිකාවන්ගේ නිවෙස් තුළ මුහුණ දෙන අභියෝග පිළිබඳව සාකච්ඡා කරන ලදී. එමෙන්ම 2025/08/16 දින වව්නියා ඔවිය හෝටල් පරිශ්‍රයේ දී රාජ්‍ය ආයතන සහ සිවිල් සංවිධාන පාර්ශවකරුවන් අතර සාකච්ඡාවක් පවත්වනු ලැබීය. මෙහිදී ඇගලුම් කර්මාන්තශාලා ආශ්‍රිත කම්කරුවන්ට අත්විදීමට සිදුවන ගැටලු පිළිබදව සාකච්ඡා කරන ලදී. මෙහිදී සාකච්ඡාවට යොදාගත් කරුණු ලෙස ළමා ගැබ්ගැනීම්, පෝෂණ ඌණතාවය, වාචික හිංසනය, ලිංගික හිංසනය, මෙන්ම ලිංගිකත්වය මත පදනම් වූ හිංසනය පිළිබඳව, සියදිවි නසාගැනීම, ආතතිය, දීර්ඝ වැඩ මුරය, ළමා උපත්, අ.පො.ස සා.පෙළින් පසු දරුවන් කර්මාන්තශාලා වෙත යොමු වීම අනාගත දැක්මක් නොමැතිකම, ගෘහස්ථ හිංසනය, මාසික වැටුප සම්බන්ධ ගැටලු මෙන්ම මානව හිමිකම්, කම්කරු නීති මෙන්ම නිවාඩු ගැනීමේ දී පවතින දුෂ්කරතා පිළිබඳ අවධානය යොමු විය.



# ප්‍රජාවගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය ගැටලු නිරාකරණයට නව වැඩපිළිවෙළක්

ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව බිම් මට්ටමේ ඇති ගැටලු ආවරණය කිරීමේ අරමුණින් 2025/07/23 දින ඩාබිඳු ඇතුලු සංවිධාන 10ක් Communµty Voices for Reproductive Rights (CVRR) නමින් ජාලගත විය. ඒ අනුව අපි ලංකාවේ කාන්තාවෝ, නිමි භාණ්ඩ හා ඇගලුම් සේවක සංගමය, STAN UP MOVEMENT LANKA, මානව විමුක්තිය උදෙසා සංවර්ධන සංවිධානය, පුරවැසි කමිටුව මානව හිමිකම් මධ්‍යස්ථානය, ශ්‍රී විමුක්ති ධීවර කාන්තා සංවිධානය, ශ්‍රමාභිමානී කේන්ද්‍රය යන ආයතන ජාලගත විය. මෙහිදී ධීවර ප්‍රජාව වෙනුවෙන් ඇගලුම් කම්හල් සේවික සේවිකාවන් වෙනුවෙන් මෙන්ම වතු කම්කරු ප්‍රජාව මෙන්ම බිම් මට්ටමේ අනෙකුත් ප්‍රජාවන් වෙනුවෙන් ක්‍රියා කරන සංවිධාන ඒකබද්ධ වීම විශේෂයකි. එහිදී ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව මෙතෙක් ලබා ගත් අත්දැකීම් දැනුම තමන් නියෝජනය කරන ප්‍රජාව සඳහා ලබාදෙන්නේ කෙසේ ද යන්න පිළිබඳව සාකච්ඡා විය. ඔවුන් ඒ සඳහා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරනු ලැබීය.

එම ව්‍යාපෘති යෝජනා හරහා සිය සේවාලාභී ප්‍රජාවන් වෙත දැනුම බෙදාදීමේ වැඩසටහන් සිය සංවිධාන මට්ටමින් සංවිධානය කරනු ලැබීය. එහි දී ලිංගික සහ ප්‍රජනක සෞඛ්‍යය, ඔසප් චක්‍රය සහ යහපැවැත්ම, ප්‍රජාව තුළ ප්‍රජනන සෞඛ්‍යය පිළිබඳ දැනුවත් කිරීම මිථ්‍යාවන් සහ වැරදි වැටහීම්, ලිංගික ආබාධ, පුද්ගලික අත්දැකීම් බෙදා ගැනීම, ළමුන් සඳහා ප්‍රජනන සෞඛ්‍ය දැනුවත් කිරීමේ වැදගත්කම ආදිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් සහ පෝෂණ වැඩසටහන් ආදිය සිදුකර තිබිණි. මෙම වැඩසටහන් ගම්පහ දිස්ත්‍රික්කය පුරා සහ පුත්තලම දිස්ත්‍රික්කය තුළ ව්‍යාප්ත විය.





# සහෝදරත්වයේ කව



ඩාබිඳු සාමූහිකයේ පුහුණුව ලත් කම්කරු නායකයින් සමඟ කටුනායක, බියගම, වව්නියා, කිලිනොච්චි ප්‍රදේශ 4 ම ආවරණය වන පරිදි සහෝදරත්ව කව සහ උතුරු ප්‍රදේශයේ කර්මාන්තශාලා මූලික කරගත් කාන්තා කමිටු සාකච්ඡා 56ක් මේ වන විට පවත්වා ඇත. මෙහිදී ලිංගිකත්වය මත පදනම් වූ ප්‍රචණ්ඩත්වය, ලිංගිකත්වය, ලිංගික අවයව, ඔසප් කළමණාකරණය බෝ නොවන රෝග, ඔසප් සනීපාරක්ෂාව, ඔසප් නිෂ්පාදන, ආරක්ෂිතව අන්තර්ජාල භාවිතය පිළිබඳව නැවත පාවිච්චි කරන සනීපාරක්ෂක තුවා, ඔසප් චක්‍රය, ඔසප් අත්දැකීම්, පෞද්ගලික අත්දැකීම් බෙදාගැනීම ආදිය සාකච්ඡා කරන ලදී. මේ සඳහා සියලු ප්‍රදේශයන්හි සාමාජිකයන් ඉතා උනන්දුවෙන් සහභාගී විය.

# වවුනියාවේ ජංගම සෞඛ්‍ය සායනය

ඇඟලුම් කර්මාන්තශාලා අතරේ දිවි ගෙවන කර්මාන්තශාලා සේවක සේවිකාවන් වෙනුවෙන් ඩාබිඳු ප්‍රධානත්වයෙන් මරිකාලවලම් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ දී ජංගම සෞඛ්‍ය සායනයක් පවත්වනු ලැබීය. මේ සඳහා සේවක සේවිකාවන් 72 ක් සහභාගී වූ අතර වව්නියා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ කාර්යය මණ්ඩලය මේ සඳහා දායක විය. මෙහි දී හිමොග්ලොබින් පරික්ෂාව, රුධිරගත සීනී පරික්ෂාව, BMI අගය පරික්ෂා කිරීම, ගැබ්ගෙල පිළිකා පිළිබඳ පරික්ෂාව, පියයුරු පරික්ෂාව සිදු කරන ලදී. මෙහිදී සහභාගී වූවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් සිදුකල අතර එහිදී ස්වයං පියයුරු පරික්ෂාව, මුරුංගා පෝෂණ ගුණාංග, ජලය පානය කිරීමේ වැදගත්කම, ඔසප් සනීපාරක්ෂාව, පෝෂදායී ආහාර පිළිබඳව සාකච්ඡා කරන ලදී.





# සෞඛ්‍ය පිළිබඳ කුසලතා සංවර්ධන වැඩමුළු



ශ්‍රී ලංකා ඇඟලුම් ක්ෂේත්‍රයේ කම්කරු කාන්තාවන්ගේ ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය අයිතීන් සහ ගෞරවාන්විත රැකියා වෙනුවෙන් උද්දේශනය කිරීමේ ඩාබිඳු සාමූහික ව්‍යාපෘතියේ දිගුවක් ලෙස ඇඟලුම් කම්හල් සේවිකාවන් 25 දෙනෙකු සඳහා ලිංගික හා ප්‍රජනන සෞඛ්‍ය පිළිබඳව දැනුවත්කිරීමේ වැඩසටහනක් කටුනායක ආයෝජන ප්‍රවර්ධන කලාපයේ කාන්තාවන් 25 දෙනකු සම්බන්ධ කරගනිමින් සීදූව සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී රවී සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙන් 2025 සැප්තැම්බර් 21 වන දින පැවැත්වීය. එසේම 2025/09/28 දින බියගම ටැමරින් හෝටල් පරිශ්‍රයේ දී ද පැවැත් වූයේ බියගම නිදහස් වෙළඳ කලාපයේ කාන්තාවන් 25 දෙනෙකු මූලික කරගනිමින් බියගම සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාලයේ සහකාර සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී එස්. එස්. විතාන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීය.

මෙහිදී සෞඛ්‍ය වෛද්‍යතුමන්ලා විසින් සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල තුළින් සිදුවන සේවාවන් පිළිබඳව සාකච්ඡා කළ අතර ලිංගිකත්වය, මිනිසෙකුගේ උපතේ සිට මහලු වියට යන තෙක්ම නිරෝගීව සිටින ආකාරය පිළිබදව, ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග, උපත් පාලන ක්‍රම පිළිබඳව දැනුවත් කිරීම සිදුවිය. එසේම දැනුවත් කිරීමේ වැඩසටහනින් අනතුරුව පෞද්ගලිකව වෛද්‍ය උපදෙස් ලබාගැනීමට ද පැමිණි පිරිසට අවස්ථාව හිමිවිය.



# වසරක ගමන් මග


















අංක: 221, වෙළබඩ පාර, කටුනායක හි පදිංචි එච්. අයි. සමන්මලී වන මා විසින් මීගමුව රන්වැකි මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.